

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව

2019

පටුන

01 පරිච්ඡේදය 1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන ව්‍යුහය 4

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය 6

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 7

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 8

02 පරිඡේදය 9

2.1 ප්‍රගතිය හා ඉදිරි දැක්ම 9

2.2 මූල්‍ය ප්‍රගතිය 12

2.3 මගී හා භාණ්ඩ ප්‍රවාහනය 14

2.4 භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය 15

2.5 මෙහෙයුම් දර්ශකය 16

2.6 සමස්ථ දුම්රිය ධාවනය 16

2.7 ඉන්ධන භාවිතය 17

2.8 ස්ථිර මාර්ග පද්ධතිය හා ඉදිකිරීම් 17

2.9 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය 18

2.10 මගී පහසුකම් හා වෙනත් සංවර්ධන කටයුතු 20

2.11 ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය 20

2.12 දුම්රිය ආරක්ෂක සේවය 21

03 පරිජේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... 23

3.1 මූල්‍ය කාර්ය සාධනය 23

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 25

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 26

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 27

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....28

3.7 මු.රෙ. 208 ප්‍රකාරව , වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 28

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.....28

3.9 විගනකාධිපති වරයාගේ වාර්තාව.....28

04 පරිජේදය - කාර්යසාධනය..... 29

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 29

05 පරිජේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය..... 29

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 29

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ජයග්‍රහන හා අභියෝග 30

06 පරිජේදය - මානව සම්පත් පැතිකඩ..... 31

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 31

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද? 31

6.3 මානව සම්පත් සංවර්ධනය 31

07 පරිජේදය - අනුකූලතා වාර්තාව..... 32

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2019 වර්ෂයේදී ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් දක්වමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල අඛණ්ඩ මෙහෙවරක යෙදෙමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්කාරී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රවාහන හා කළමනාකරණ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ.මෙම දෙපාර්තමේන්තුව දුම්රිය ඇඳ්දා පනතේ ඇති විධිවිධානයන්ට යටත්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්රිය සාමාන්‍යාධිකාරී දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශාඛා හා ඒකක 14 ක් යටතේ පරිපාලනය කටයුතු විමධ්‍ය ගතවී තිබෙන අතර අදාල උප දෙපාර්තමේන්තුවේ, ශාඛාවේ, ඒකකයේ ප්‍රධානියා විසින් පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු බලයි.

රටේ සම්ස්ථ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 1,479.51 දිගු දුරකින් යුතුව සමස්ථ දුම්රිය ස්ථාන 418 සමග මගී ජනතාවගේ හා භාණ්ඩ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. තම මුඛ්‍ය පරමාර්ථය වූ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම හා පරිසර හිතකාමී හා පිරිමැසුම්කාරී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ඉහළ කැපවීමකින් කටයුතු කරනු ලබයි. 2019 වර්ෂයේදී ද විවිධ භාධක හා අභියෝගයන් මධ්‍යයේ වුවද තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි විය.

පාස්කු ප්‍රහාරය හමුවේ දුම්රිය ප්‍රවාහන කටයුතු මාස දෙකක පමන කාලයක් ඇණහිටි අතර අවස්ථා හතරකදි පැවති දුම්රිය වැඩ වර්ජනය හමුවේද මගී ප්‍රවාහනය හා දුම්රිය ආදායම අඩුවී තිබීම මෙම වසරේදී දුම්රිය දෙපාර්තමේන්තුව මුහුනදුන් ප්‍රධාන පසුබෑම වේ.

මෙවැනි විවිධ භාධක හමුවේ වුවද මගී ජනතාව සඳහා කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. චීනයෙන් හා ඉන්දියාවෙන් ආනයන කරන ලද නවීන දුම්රියන් දුර ගමන් සේවා සඳහා යෙදවීම, නව දුම්රියන් හඳුන්වාදීම ආදිය මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යුහුසුළුව කටයුතු කරන ලදී.

දැක්ම

දකුණු ආසියාවේ වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම.

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායී, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම.

අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- කළමනාකරණ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- මගී ප්‍රවාහනය කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන ව්‍යුහය


GENARAL MANAGER RAILWAY
A.G.M. (O)
A.G.M. (I)
A.G.M. (M)
A.G.M (A)
C.F.O
DEC P&P
CIA
D P
DGMP
SRP
DIT
DGMT
DGM C
CE(S)
CE(W)
CEM
CEMO
DGM(T)
DGM
CA
SE P&P
ST
SC
DES
SES
SS
DEBU
DEBR
DEw
SEW
DEME
DEM
DEMO
DCET
SEME
SEM
D(A)
AC
E P&P
AST
MAR
EP
ES
S
EW
CM
EE
EM
ATE
ATM
EM
ET
ADP
SP
DSRP
ADE
ASP
ASRP
LGO
ADA

Level 1 **G.M.R** – General Manager railway

Level 2 **AGM(A)** – Addl. General Manager(Admin) , **AGM(M)** - Addl. General Manager(Mechanical), **A.G.M. (M)** - Addl. General Manager(Infrastructure), **A.G.M. (O)**- Addl. General Manager(Operation), **C.F.O** – Chief Finance officer ,

Level 3 **DGM**-Deputy General Manager (Admin) , **DGM(T)** - Deputy General Manager (Training & HR) , **CEM** – Chief Engineer (Motive Power), **CME**- Chief Mechanical Engineer, **CE(W)** Chief Engineer (Way & works), **CSTE**- Chief Engineer (Signal & Telecommunication), , **DGM(C)** - Deputy General Manager (Commercial) , **DGMT**- Deputy General Manager (Transport) , **CIA**- Chief Internal Auditor , **CA**- Chief Accountant , SRP- Superintendent(RP) , **DGMP** - Deputy General Manager (Procurement) , **D P** – Director (Planning)

Level 4 **D(A)**-Director (Admin) , **DCET** - Deputy Chief Engineer (Training & HRB), **DEMO** - Deputy Chief Engineer (Motive Power), **DEM**- Deputy Chief Engineer (Mechanical), **DEME** - Deputy Chief Engineer (Electrical) , **DEW** - Deputy Chief Engineer (Way & Works) , **DEBR** - Deputy Chief Engineer (Way & Bridges), **DEBU** - Deputy Chief Engineer (Property Development & Building) , **DES** - Deputy Chief Engineer (Signal & Telecommunication), **SC** – Superintendent Commercial , **ST** – Superintendent Transportation , **DEC (P&P)** - Deputy Chief Engineer (Project & Plan)

Level 5 **SEM** – Superintendent Engineer (Motive Power), **SEME** - Superintendent Engineer (Mechanical), **SEW** - Superintendent Engineer (Way & works), **SS** – Surveyor Superintendent , **SES** - Superintendent Engineer (Signal & Telecommunication), **SEP** - Superintendent Engineer (Planning Project) , **MAR** – Deputy Superintendent (Sales & Marketing) , **DIT** - Deputy Director (Information Technology) , **DSRP** - Deputy Superintendent (R.P) , **SP** – Superintendent (Procurement) , **SE (P&P)** - Superintendent Engineer (Project & Plan)

Level 6 **ADA** – Assistant Director (Admin) / Deputy Director (Admin), **LGO** – Legal Officer , **ET** – Engineer (Training & HRB) , **EM** – Engineer (Motive Power), **ATM** – Asst. Transportation Superintendent (Mechanical) , **ATE** - Asst. Transportation Superintendent (Energy Conservation) , **EM** – Engineer (Mechanical), **EE** – Engineer (Electrical) , **CM** – Chemist & Methodologist , **EW** – Engineer (Way & Works) , **S** – Surveyor , **ES** – Engineer (Signaling & Telecommunication) , **EP** – Engineer (Planning & Project) , **AC** – Asst. Director / Deputy Director (Cost) , **AST** – Asst. Superintendent (Transportation / Commercial) , **AC** – Accountant , **ADE** – Asst. Director (Information Technology) , **ASRP**-Asst. Superintendent (R.P), **ASP** – Asst. Superintendent (Procurement), **ADP** – Asst. Director (Planning) , **E (P&P)** - Engineer (Project & Plan)

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු , අංශ හා ඒකක හා මාර්ග ජාලය

උප දෙපාර්තමේන්තු , අංශ හා ඒකක

ඃ	උප දෙපාර්තමේන්තු/ඒකක	උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන්
01	දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය	
02	ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
03	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත
04	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු(ධාවන බල)
05	ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ)
06	ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන මූල්‍ය නිලධාරි
07	වාණිජ උප දෙපාර්තමේන්තුව	වාණිජ අධිකාරි
08	දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව	ගබඩා අධිකාරි
09	ගමනාගමන උප දෙපාර්තමේන්තුව	ගමනාගමන අධිකාරි
10	ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය	ආරක්ෂක අධිකාරි
11	ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි පුහුණු හා මානව සම්පත්
12	ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය	ප්‍රධාන පිරිවැය නිලධාරි
13	සැලසුම් ඒකකය	අධ්‍යක්ෂ (සැලසුම්)
14	දත්ත සැකසුම් ඒකකය	කළමනාකරු දත්ත සැකසුම්

වගු අංක 01

දුම්රිය මාර්ග ජාලය

මාර්ගය	දුර KM	දුම්රිය ස්ථාන සංඛ්‍යාව	උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව	දුම්රිය හෝල්ට්
මුහුදුබඩ මාර්ගය (කොළඹ කොටුව සිට බෙලිඅත්ත දක්වා)	186	41	33	0
ප්‍රධාන මාර්ගය (කොළඹ කොටුව සිට බදුල්ල දක්වා)	292.38	45	33	26
මාතලේ මාර්ගය (පේරාදෙනියේ සිට මාතලේ දක්වා)	33.75	06	06	12
පුත්තලම් මාර්ගය (රාගම සිට පුත්තලම දක්වා)	119.57	19	25	0
පුත්තලගම අරුවක්කාලු මාර්ගය	37.00	1	-	-
කැලණිවැලි මාර්ගය (මරදාන සිට අවිස්සාවේල්ල දක්වා)	59.27	11	19	7
වරාය මාර්ගය	7.00	1	-	-
කොලොන්නාව මාර්ගය	3.18	1	-	-
උතුරු මාර්ගය (පොල්ගහවෙල සිට කන්කසන්තුරය දක්වා)	339.47	31	26	17
තලෙයිමන්නාරම් මාර්ගය (මැදවච්චියේ සිට තලෙයිමන්නාරම දක්වා)	106.06	07	04	0
මිහින්තලේ මාර්ගය	13.50	01	0	2
මඩකලපු මාර්ගය (මහව සිට මඩකලපුව දක්වා)	211.11	14	17	05
ත්‍රිකුණාමල මාර්ගය (ගල්ඔය හංදියේ සිට ත්‍රිකුනාමලය දන්වා)	70.23	04	02	02
එකතුව	**1,479.51**	**182**	**165**	**71**

වගු අංක 02

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතන හෝ අරමුදල් නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇ.ඩො/රු.මි	ව්‍යාපෘති කාල සීමාව	විස්තරය
1	දුම්රිය බලවේග කට්ටල06 ක් මිලදී ගැනීම (ඉන්දියානු ණය ආධාර)	58.04	2017.12.28 2019.10.28 (මාස 22)	නිම කර ඇත.
2	දුම්රිය ඇන්ජින් 10 ක් මිලදී ගැනීම (ඉන්දියානු ණය ආධාර)	42.50	2018.05.14 2020.05.14 (මාස 24)	ඇන්ජින් 08 ක් ආනයනය සිදු කර ඇත.
3	මගී මැදිරි 160 ක් මිලදී ගැනීම (ඉන්දියානු ණය ආධාර)	86.000	2018.09.07 2020.12.07 (මාස 27)	මැදිරි 80 ක් 2020.12 වන මාසයේ ලංකාවට පැමිනිමට නියමිතය
4	තෙල් ටැංකි වැගන් 30ක් මිලදි ගැනීම (ඉන්දියානු ණය ආධාර)	2.57	2018.01.30 2019.07.30 (මාස 18)	නිම කර ඇත.
5	කන්ටේනර් වැගන 20 ක් මිලදී ගැනීම (ඉන්දියානු ණය ආධාර)	1.69		-
6	දුම්රිය එන්ජින් 12 ක් මිලදී ගැනීම (USD)	48.67		ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ
7	උඩරට දුම්රිය මාර්ගය සඳහා බලවේග කට්ටල 09 ක් මිලදී ගැනීම (චීනය)	93.86	2018. සැප්තැම්බර් ... 2020.මැයි ... (මාස 20)	බලවේග කට්ටල 5 ක් ගෙන්වා ඇත.
8	ආරක්ෂිත දුම්රිය මාර්ග පද්ධති 200 ක් ස්ථාපිත කිරීම	6,47	2016.10.26 2019.01.27	නිමකර ඇත
9	මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම	රු.මි 2,745.02	2017.05.17 2020.09.17	මැදිරි 140 ක් පුනරුත්ථාපන කටයුතු සිදුකර අවසන් කර ඇත.
10	පොල්ගහවෙල කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම (21.45Km)	52.00	වසර 2	ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ
11	මහව ඕමන්තේ දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය ඉදිකිරීම (129.77Km)	91.268	වසර 3	ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....

දුම්රිය ප්‍රවාහනය ලාභදායී හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ප්‍රධාන ප්‍රවාහන පාර්ශව කරුවකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රවාහන සේවා කටයතු වල නියැලෙමින් සිටී. වර්තමානයේ මගී ප්‍රවාහන කටයුතු සඳහා වැඩි නැඹුරුතාවයකින් කටයුතු කරන ශ්‍රී ලංකා දුම්රිය සේවය කාර්යාල සේවා, දුර ගමන් සේවා, නගරාන්තර දුම්රිය සේවා විශේෂ සංචාරක හා ආගමික කටයුතු සඳහා ක්‍රියාත්මක වන විශේෂ දුම්රිය සේවා පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ දල දේශීය නිෂ්පාදිතයේ සේවා අංශයේ වෘද්ධිය සඳහා දායකත්වය ලබා දෙමින් විවිධ අභියෝගයන් හා ගැටළු හමුවේ වුවද වඩා කාර්යක්ෂම දුම්රිය සේවයක් සැපයීම වෙනුවෙන් අඛණ්ඩ ප්‍රයත්නයක නියැලි සිටී.

දෛනිකව 411 කට ආසන්න දුම්රිය ප්‍රමාණයක් හා එමඟින් දුම්රිය මගීන් ලක්ෂ 4 ක ආසන්න ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර භාණ්ඩ හා තෙල් දුම්රිය ගමන් වාර 23 ක් පමණ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවයේ ගුණාත්මක වර්ධනයක් අපේක්ෂාවෙන් ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ දුම්රිය ඇන්ජින් 10 ක්, බලවේග කට්ටල 06 ක් හා මගී මැදිරි 160 ක් තෙල් ටැංකි 30 ක් හා කන්ටේනර් වැගන් 20 ක් මිලදී ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබීය. ඉහත ප්‍රසම්පාදනයන්ට සමගාමීව උඩරට දුම්රිය මාර්ගයේ ධාවනය වැඩි දියුණු කිරීම සඳහා දුම්රිය එන්ජින් 12 ක් හා බලවේග කට්ටල 09 ක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී. සේවයෙන් ඉවත් කරන ලද මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම හා ආරක්ෂක දුම්රිය හරස් මාර්ග පද්ධති 200 ක් ස්ථාපිත කිරීම ආදී දුම්රිය සේවයේ දියුණුව සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන දුම්රිය සංවර්ධන ව්‍යාපෘතීන් වේ. තවද ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය සේවය වැඩි දියුණු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබෙන අතර දුම්රිය සේවයේ අභිවෘද්ධිය සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමද (Railway Master Plan) ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වේ.

එමෙන්ම මගී හා භාණ්ඩ දුම්රිය ප්‍රවාහන කටයුතු වල ගුණාත්මකභාවය තව දුරටත් වර්ධනය කිරීම සඳහා මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම හා මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගය ඉදි කර මෙහෙයුම් කටයුතු සඳහා ලබාදීම දුම්රිය සංවර්ධනය සඳහා 2019 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වේ.

තවද මුහුදුබඩ දුම්රිය මාර්ගයේ දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්යේ මූලික කටයුතු ආරම්භ කිරීම හා මීගමුව දුම්රිය මාර්ගයේ කටුනායක සිට ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ඊට අමතරව ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ මිලදී ගනු ලබන බලවේග කට්ටල 6 ක් ආනයනය කර සේවය සඳහා යොදවන ලද අතර තෙල් ටැංකි 30 හා කන්ටේනර් වැගන් 20 ද ආනයනය කරන ලදී. දුම්රිය එන්ජින් 10 න් දුම්රිය එන්ජින් 8 ක් ආනයනය කර සේවය සඳහා යොදවා ගන්නා ලදී. උඩරට දුම්රිය මාර්ගය සඳහා චීනයෙන් මිලදි ගැනීමට නියමිත බලවේග කට්ටල් 9 න් 5 ක් ආනයනය කර උඩරට දුම්රිය මාර්ගය සඳහා එක් කරන ලදී.

2019 වසරේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අත්පත් කරගත් ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගය මගී ජනතාව සඳහා විවෘත කිරීමයි. ඒ යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා වූ කි.මී. 26.09ක නව දුම්රිය මාර්ග පද්ධතිය ජනතා අයිතියට පත් කරමින් ජනතාවට සුවපහසු කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවයක් ලබා දීමට කටයුතු කරනු ලැබීය.

2019 වර්ෂයේදී මගීන් මිලියන 128.47 ක් ගමන් කල අතර මගී කිලෝමීටර් මිලියන 7,309.56 ක දුර ප්‍රමාණයක් ධාවනය කර ඇත. එමෙන්ම භාණ්ඩ ටොන් මිලියන 1.80 ක් ප්‍රවාහනය කරමින් හා භාණ්ඩ ටොන් කිලෝමීටර් මිලියන 115.62 ක් ධාවනය කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සිය අඛණ්ඩ දායකත්වය ලබා දුනි.

මෙම වර්ෂයේදී මගී ප්‍රවාහන සේවා පුළුල් කරමින් අළුතින් ආනයනය කරන ලද දුම්රිය එංජින් හා බලවේග කට්ටලද යොදමින් පහතින් දක්වා ඇති නව මගී දුම්රිය සේවා කීපයක් හඳුන්වා දීමට හැකි වූ අතර ඒ තුළින් දුම්රිය කෙරෙහි මගී ආකර්ෂණයක් ලබා ගැනීමට හැකි වුණි.

- කොළඹ කොටුව - බදුල්ල (දෙනුවර මැණිකේ) නගරාන්තර දුම්රිය සේවයක් ආරම්භ කිරීම
- කොළඹ කොටුව - පොලොන්නරුව (පුලතිසි) නගරාන්තර දුම්රිය සේවයක් ආරම්භ කිරීම
- මරදාන - බෙලිඅත්ත (දක්ෂිණ) නගරාන්තර දුම්රිය සේවයක් ආරම්භ කිරීම
- බෙලිඅත්ත සිට මාතර දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම
- ගාල්ල සිට අළුත්ගම දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම
- බෙලිඅත්ත සිට ගාල්ල දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම
- කොළඹ කොටුව සිට හෝමාගම දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම
- මගී සුව පහසුව ඇති කිරීම සඳහා දිනපතා මරදාන සිට වාද්දුව දක්වා ධාවනය වූ දුම්රිය දකුණු කළුතර දක්වා දීර්ඝ කිරීම
- මරදාන සිට මාතර දක්වා ධාවනය වූ දුම්රිය බෙලිඅත්ත දක්වා දීර්ඝ කිරීම
- මාතර සිට ආරම්භ වී මරදාන දක්වා ධාවනය වූ දුම්රිය බෙලිඅත්ත දුම්රිය ස්ථානයේ සිට ආරම්භ වීම
- කොළඹ කොටුව සිට වව්නියාව බලා ධාවනය වූ නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය යාපනය දක්වා දීර්ඝ කිරීම

භාණ්ඩ ප්‍රවාහන කටයුතු ද තව දුරටත් වර්ධනය කරමින් සිමෙන්ති ප්‍රවාහන කටයුතු හා ඛණිජ තෙල් ප්‍රවාහන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකි විය. තවද ප්‍රීමා පිටි ප්‍රවාහනය සඳහා එම ආයතනය සමග අත්සන් කරන ලද ගිවිසුමට අනුව අදාල දුම්රිය ඇණිය ගෙන්වා ගැනීමට කටයුතු කරන ලද අතර ඒ අනුව ප්‍රීමා සමාගමේ පිටි ප්‍රවාහන කටයුතු දුම්රිය මගින් සිදු කිරීමට අපේක්ෂිතය.

ඉදිරි දැක්ම

වර්තමාන ප්‍රවාහන ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මාර්ග තදබදය සඳහා විසඳුම් ලබාදීමයි. ඒ අනුව මහා මාර්ගයේ ගමන් ගන්නා මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු දුම්රිය වෙත යොමු කිරීම ප්‍රධාන අභිලාශයක් වේ. එහිදි "සෞභාග්‍ය දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ දුම්රිය යටිතල පහසුකම් වර්ධනය කර ඉතා කාර්යක්ෂම හා සකසුරුවම් දුම්රිය සේවාවක් ලබාදීම ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දුම්රිය ඉදිරි සැළසුම් මෙම පරමාර්ථය මුල් කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ වඩාත් ආකර්ෂණීය හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවයේ පහත සඳහන් සාධනීය සංවර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම
- පානදුර - කොළඹ - වේයන්ගොඩ, රාගම - මීගමුව සහ මරදාන - හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හදුන්වා දීම හා සාමාන්‍ය දුම්රිය සේවා වලට අමතරව සුඛෝපභෝගි කාර්යාලීය හා නගරාන්තර දුම්රිය සේවාවක් ආරම්භ කිරීම
- දුම්රිය සේවාව නවීකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හදුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම සඳහා ඔන්ලයින් සේවාවක් සහ ඊට සමගාමීව ඊ-ප්‍රවේශපත්‍ර සහ ස්වයංක්‍රීය ඇතුළුවීමේ - පිටවීමේ දොරටු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එංජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීම හා කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය යන වරාය වල දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම
- දුම්රිය ස්ථාන හා බැඳුනු ප්‍රධාන නගරවල ඇති දුම්රිය ඉඩම් භාවිතයට ගෙන සාප්පු සංකීර්ණ, මූල්‍ය සේවා, හෝටල්, කාර්යාල, සිනමාශාලා, විනෝද මධ්‍යස්ථාන සහ තට්ටු නිවාස ඉදිකරමින් වාණිජ මධ්‍යස්ථාන බවට පත්කර දුම්රිය සේවාවේ ආදායම ඉහල නැංවීම

ඉදිරි සංවර්ධන ව්‍යාපෘති

01. දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම
02. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය සේවා සංවර්ධන කටයුතු
03. දුම්රිය ඇණිය වැඩි දියුණු කිරීම සඳහා දුම්රිය එංජින් හා බලවේග කට්ටල මිලදී ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
04. මහව - ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය
05. පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
06. කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.
07. පුත්තලම දුම්රිය මාර්ගයේ කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම

08. නව කැළණි පාළම ස්ථාපිත කිරීම

09. දුම්රිය සේවය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම

10. ඉලෙක්ට්‍රෝණික ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හදුන්වාදීම

11. දේශීයව මගී මැදිරි නිෂ්පාදනය ආරම්භ කිරීම

12. නව දුම්රිය සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම

13. ආරක්ෂිත දුම්රිය හරස්මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම

14. මගී මැදිරි පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රගතිය

2018 සහ 2019 වසරවලදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයාගත් ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගු වල දක්වා ඇත.

ආදායම

#	ආදායම් කාණ්ඩය	මුළු ආදායම (රු.මි.)	
		2018	2019
01	මගී	5933.28	6,386.97
02	පාර්සල් සහ තැපැල්	209.82	125.68
03	භාණ්ඩ හා පශු සම්පත්	418.23	435.02
04	වෙනත්	851.11	953.65
	එකතුව	**7,412.51**	**7,901.32**

වගු අංක 04

වියදම

වියදම් කාණ්ඩය	මුළු වියදම රු.මි	
	2018	2019
පුනරාවර්ථන වියදම	14,380.54	15,463.53
ප්‍රාග්ධන වියදම	15,248.63	20,402.25
එකතුව	**29,629.17**	**35,865.78**

වගු අංක 05

2.2 දුම්රිය ඇණිය

ඉන්දීය ණය ආධාර යටතේ ඉන්දියාවෙන් ආනයනය කරන ලද බලවේග කට්ටල් 6ක් හා එන්ජින් 10ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කටයුතු කරන ලදී.



2019 වර්ෂයේදී ඉන්දියාවෙන් ආනයනය කරන ලද M11 එන්ජිම

මීට අමතරව උඩරට දුම්රිය මාර්ගය සඳහා චීනයෙන් ආනයනය කරන ලද චිස් - 14 බලවේග කට්ටල දෙකක් කොළඹ කොටුව සිට බදුල්ල දක්වා නගරාන්තර ධාවන කටයුතු සඳහා යොදා ඇත.



2019 වර්ෂයේදී චීනයෙන් ආනයනය කරන ලද S14 වර්ගයේ බලවේග කට්ටලය

තවද ඉන්දීය ණය ආධාර යටතේ ගෙන්වන ලද කන්ටේනර් වැගන් 20 හා තෙල් ටැංකි 30 ද 2019 වසර අවසන් වන විට ආනයනය කරන ලදී. සියළු තෙල් ටැංකි තෙල් ප්‍රවාහන කාර්ය වෙනුවෙන් ද භාවිතා කෙරේ.

2019 වර්ෂයේ වඩා හොඳ සේවයක් සැපයීම සඳහා දුම්රිය ඇණිය බොහෝ ප්‍රයෝජනවත් වූ අතර දුම්රිය සේවය සඳහා යොදවා තිබූ දුම්රිය ඇණිය පහත පරිදි දැක්විය හැකිය.

සේවයේ යෙදවූ දුම්රිය ඇණිය - 2019

අංකය	වර්ගය	සංඛ්‍යාව
01	දුම්රිය එංජින්	79
02	බලවේග කට්ටල	92
03	මගී මැදිරි	579
04	ගැල්	1,008

වගු අංක 06

මගී මැදිරි සහ දුම්රිය එන්ජින් අලුත්වැඩියාව සහ නඩත්තුව අඛණ්ඩව සිදු කිරීම තුළින් 2019 වර්ෂය තුළ දුම්රිය ඇණිය සඳහා සුළු අලුත්වැඩියාවන් 39,642 ක් හා මහා පරිමාන අලුත්වැඩියාවන් 1,612 නිම කර ඇත. තවද පුනරුත්ථාපනය කරන ලද මගී මැදිරි 16ක් ද සේවයට එක් කිරීමට හැකි විය.

මීට අමතරව භාවිතයෙන් ඉවත් කරන ලද මගී මැදිරි 200 ප්‍රනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වසර අවසන් වන විට මගී මැදිරි 140 ක් පුනරුත්තාපන කටයුතු සිදුකර අවසන් කරන ලදී. ඒ අතිරින් රුමේනියන් මැදිරි 108 ක් හා චිස්-8 බලවේග කට්ටල මැදිරි 32 ක් පුනරුත්තාපනය සිදුකර ධාවන කටයුතු සඳහාද යොදවා ඇත.

2.3 මගී හා භාණ්ඩ ප්‍රවාහනය

2018 වර්ෂයේ මගීන් මිලියන 137.52 ක් දුම්රියෙන් ගමන් කරන ලද අතර 2019 වර්ෂයේදී 128.47 ගමන් කර ඇත. එය 2018 වර්ෂයට සාපේක්ෂව අඩු වීමක් දක්වයි. මෙලෙස මගීන් ගේ අඩුවීම සඳහා ප්‍රධාන ලෙසම බලපාන ලද කරුණු වුයේ පාස්කු ප්‍රහාරයත්, අඛණ්ඩව සිදු කරන ලද දුම්රිය වර්ජන ආදියයි. මගී සංඛ්‍යාව අඩු වුවද මගී ආදායමේ 7% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මේ සඳහා ප්‍රධාන හේතු සාධකය වුයේ 2018 වර්ෂයේ ඔක්තෝම්බර් 01 දින සිට දුම්රිය ගාස්තු වැඩිවීමයි.

ගමන්කල මගී සංඛ්‍යාව හා මගී ආදායම

වර්ෂය	ගමන්කළ මගීන් සංඛ්‍යාව (මි.)	මගී ආදායම රු. (මි.)	මගී කි.මි. (මි.)
2018	137.52	5,933.28	7,709.50
2019	128.47	6,386.96	7,309.56

වගු අංක 07



ප්‍රස්ථාර අංක 01



ප්‍රස්ථාර අංක 02

2.4 භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

වර්ෂය	භාණ්ඩ ආදායම රු.(මි)	භාණ්ඩ ප්‍රමාණය (ටොන් මි.)	ටොන් කිලෝමීටර් ප්‍රමාණය (මි)
2018	418.22	1.83	119.78
2019	435.02	1.80	115.62

වගු අංක 08



ප්‍රස්ථාර අංක 03



ප්‍රස්ථාර අංක 04

2.5 මෙහෙයුම් දර්ශකය

අංකය	කාර්ය සාධන දර්ශකය	2019
01	දුම්රිය ආදායම (රු.මි.)	7,901.02
02	ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන)	128.47
03	මගී කි.මී. ප්‍රමාණය (මිලියන)	7,309.56
04	ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන)	1.80
05	භාණ්ඩ ටොන් කි.මී. (මිලියන)	115.62

වගු අංක 09

2.6 සමස්ථ දුම්රිය ධාවනය

දුම්රිය සේවය	සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව
තද්‍රාසන්න	70,001	65,759
ප්‍රාදේශීය	28,090	24,803
දුරස්ථ හා නගරාන්තර	22,095	20,770
රේල් බස්	4,764	3,900
i. මගී	124,950	115,232
ii. භාණ්ඩ	8,913	6,659
එකතුව	133,863	121,891

වගු අංක 10

ඉහත වගු අංක 10 හි දැක්වෙන තොරතුරු අනුව 2019 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව 133,863ක් වූ අතර එයින් 121,891 ක් ධාවනය කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 91 % කි. මගී හා භාණ්ඩ දුම්රිය ධාවන කටයුතු අඩුවීමට පාස්කු ප්‍රහාරය හා දුම්රිය වර්ජන සෘජුවම බලපාන ලදී.

2.7 ඉන්ධන භාවිතය

දුම්රිය එංජින් හා බලවේග කට්ටල සඳහා පහත පරිදි ඉන්ධන භාවිතා කර ඇත.

විස්තරය	2018	2019
ඩීසල් ලීටර් මිලියන	37.57	33.92
ඉන්ධන සඳහා වියදම (රු.මි)	3,858.08	4,315.60

වගු අංක 11

2019 වර්ෂයේ ඉන්ධන භාවිතය ලීටර් මිලියන 33.92 ක් වූ අතර ඒ සඳහා රු.මි. 4,315.60 ක වියදමක් දැරීමට සිදු විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ භාවිතා කරන ලද ඉන්ධන ලීටර් මිලියන 3.65 ක ප්‍රමාණයේ අඩුවීමක් හඳුනාගත හැක. එයට බලපාන ලද ප්‍රධානතම සාධක වූයේ මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැඩවර්ජන, පාස්කු ප්‍රහාර හේතුවෙන් දුම්රිය ධාවනය සීමා කිරීමයි. තවද සති අන්තයේ ගමනාන්ත දක්වා යොදවන ලද දුම්රියන් නැවත අංගනයන් වෙත ගෙන්වා නොගෙන සතිය ආරම්භයේ මඟින් සමග ගෙන්වා ගැනීමත්ය.

ඉන්ධන භාවිතයේ අඩුවක් සිදු වුවද ඒ සඳහා වැය කරනු ලැබූ මුදල 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ රුපියල් මිලියන 465.52 කින් වැඩි වී ඇත. එයට බලපාන ලද ප්‍රධානතම සාධකය වනුයේ 2019 වසර තුළ ඉන්ධන මිල වැඩි වීමයි.

2.8 ස්ථිර මාර්ග පද්ධතිය හා ඉදිකිරීම්

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පීලි අඩි 205,673 ක් ද කොන්ක්‍රීට් සිල්පර 49,561ක්ද දැව සිල්පර 70,183 ක්ද බැලස්ට් කියුබ් 30,308ක් ද භාවිතා කෙරිණි.

දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කර ගත් ද්‍රව්‍ය

යොදා ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පීලි අඩි	205,673
දැව සිල්පර	70,183
වානේ සිල්පර	1,047
කොන්ක්‍රීට් සිල්පර	49,561
බැලස්ට් කියුබ්	30,308

වගු අංක 12

පුත්තලම දුම්රිය මාර්ගයේ කටුනායක සිට කුරණ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම් කටයුතු නිම කිරීම, මහව-ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය මූලික කටයුතු හා මහනුවර - පේරාදෙණිය - කඩුගන්නාව මාර්ගයේ මූලික කටයුතු ද, දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව දුම්රිය ස්ථාන ගොඩනැගිලි අලුත් වැඩියාව හා නඩත්තු කටයුතු වසර තුළදී සිදුකරන ලදී. තවද ඔස්ට්‍රියානු රජයේ ණය ආධාර යටතේ නව කැළණි පාළම ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර එහි මූලික කටයුතු සිදු කරමින් පවතී.

මුදල් අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ පේරාදෙණිය, හැටන්, මාතලේ, හලාවත, අළුත්ගම, අම්බලන්ගොඩ, අහුංගල්ල, මාතර, ත්‍රිකුණාමලය, මඩකලපුව, පුත්තලම, කටුනායක, කඩුගන්නාව, රඹුක්කන, පොල්ගහවෙල, මොරටුව යන දුම්රිය ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

එමෙන්ම හික්කඩුව, උණවටුන, බෙන්තොට, කළුතර දකුණ, මීගමුව යන දුම්රිය ස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා දුම්රිය ස්ථාන නවීකරණය සිදුකිරීම සංචාරක මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ සිදු කරන ලදී.

2019 වර්ෂයේදී වේගසීමා ඉවත්කර කාර්යක්ෂම දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන ලදී.

අංකය	මාර්ගය	ඉවත් කළ වේග සීමා
01	මධ්‍යම දිස්ත්‍රික්කය	21
02	පහළ දිස්ත්‍රික්කය	11
03	ඉහළ දිස්ත්‍රික්කය	17
04	උතුරු දිස්ත්‍රික්කය	38
05	නැගෙනහිර දිස්ත්‍රික්කය	53
	එකතුව	140

වගු අංක 13

2.9 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

ආරක්ෂාකාරී හා කාර්යක්ෂම දුම්රිය සේවයක් පවත්වාගැනීම සඳහා දුම්රිය සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වේ. පිහිටුවා ඇති සංඥා පද්ධති නිසිලෙස නඩත්තු කර යථා ක්‍රියාකාරී මට්ටමකින් පවත්වා ගැනීම සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යභාරයකි. එමෙන්ම මේ වන විට දුම්රිය මාර්ග පද්ධතිය පුරා පිහිටුවා ඇති ක්‍රියාකාරී දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති සංඛ්‍යාව 500කට අධික වන අතර ඒවාද නිසි ලෙස නඩත්තු කර නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ මනා නඩත්තුව හා නවීකරණ කටයුතු දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මනා පිටිවහලක් සපයයි. 2019 වර්ෂය තුළදීද සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව අඛණ්ඩව නඩත්තු කටයුතු සිදුකරන ලදි.

සංඥා පද්ධතියේ වීදිනෙදා නඩත්තු කටයුතු වලට අමතර වශයෙන් පහත පරිදි නවීකරණ කටයුතු සිදුකිරීමටද 2019 වර්ෂය තුළදී මූලිකත්වය දීම මගින් දුම්රිය සේවයේ ඵලදායිතාව ඉහළ නැංවීමට සමත් වී ඇත.

මාර්ග හා කර්මාන්ත අංශය මඟින් ඉදිකිරීම් කටයුතු නිම කරන ලද සීදුව - කටුනායක ද්විත්ව දුම්රිය මාර්ගය සඳහා කාර්යක්ෂම හා ඵලදායි ලෙස දුම්රිය ධාවනය කිරීම සඳහා සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කෙරුණි. මෙහිදී දුම්රිය ගමනාගමනය අතරතුරදී එම ධාවනයන්ට සිදුවන බාධාවන් අවම වන පරිදි පෙර කාර්යයන්ට සාපේක්ෂව අඩු කාලසීමාවක් තුළදී සංඥා පද්ධතියේ වැඩකටයුතු නිම කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලැබූ විශිෂ්ඨ ජයග්‍රහනයකි.

පොල්ගහවෙල සිට මහව දක්වා වන සියලුම දුම්රිය අංගන සහ ඒ හා අනුබද්ධිත සියලු සංඥා පද්ධති වර්ණ සංඥා පද්ධති බවට පත් කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කරමින් පොතුහැර - පොල්ගහවෙල අතර දුම්රිය කොට්ඨාශයේ පහත අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා විදුලි සීනු දුම්රිය - හරස්මාර්ග අනතුරු ඇඟවීම් පද්ධති සවිකිරීමද 2019 වර්ෂයේදී සිදු කෙරිණි.

- වාගොල්ල - කදුරුකුඹුර මාර්ගය
- නයිලිය පහළගම වෙලමැද දුම්රිය හරස් මාර්ගය
- නයිලිය දුම්රිය ස්ථානය අසල දුම්රිය හරස් මාර්ගය

තවද කටුනායක - සීදුව ද්විත්ව මාර්ග සංඥා පද්ධතිය ලබා දීමේදී හා අනෙකුත් මාර්ගවල පහත පරිදි හරස් මාර්ග සංඥා පද්ධති සවිකිරීම හා නවීකරණය කිරීමද සිදුවිය.

- කටුනායක පන්සල පාර
- කටුනායක දුම්රියපොල පාර
- නුගගහ පාර
- කටුනායක නායක පාර
- ලියනගේමුල්ල පල්ලිය පාර
- තලවත්තේගෙදර දුම්රිය හරස් මාර්ගය
- වාද්දුව බෝධිරාජ මාවත
- කටුකුරුන්ද හරස් මාර්ගය
- පැල්පොලවත්ත දුම්රිය හරස් මාර්ගය
- සමගි මාවත

හඳුනාගත් දුම්රිය හරස් මාර්ග සඳහා දුම්රිය පැමිණීම දර්ශනය වන පරිදි දර්පණ සවිකිරීමටද මේ වසරේදී විශේෂ අවධානයක් යොමුවිණි.

රාජකාරී දුම්රිය තදබදය අවම කිරීම සඳහා මරදාන සිට රාගම දක්වා බ්ලොක් කොට්ඨාශ හඳුන්වාදුන් අතර නව බ්ලොක් සංඥා පද්ධතිය පිහිටුවා ධාවනය සඳහා ලබාදීමද 2019 වර්ෂය තුළදී සිදුකරන ලද සංඥා පද්ධති නවීකරණයේ තවත් සුවිශේෂී පියවරකි.

අනාරක්ෂිත දුම්රිය හරස්මාර්ග 200ක් සඳහා විදුලි සීනු සංඥා ආරක්ෂණ පද්ධති පිහිටුවීමේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර ඊට අමතරව නව විදුලි සංඥා ආරක්ෂා පද්ධති 200ක් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරනු ලැබීය.

2.10 මගී පහසුකම් හා වෙනත් සංවර්ධන කටයුතු

- ආබාධිත මගීන් සඳහා පහසුකම් සංවර්ධනය කිරීම (රෝද පුටු, ආබාධිත පුද්ගලයින්ට ගමන් කිරීම සඳහා මංතීරු ඉදි කිරීම, වැසිකිලි පහසුකම් ඇති කිරීම, ආබාධිත ප්‍රවේශ මාර්ග ඇති කිරීම).
- බෙලිඅත්ත සිට මාතර දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම.
- ගාල්ල සිට අළුත්ගම දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම.
- බෙලිඅත්ත සිට ගාල්ල දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම.
- කොළඹ කොටුව සිට හෝමාගම දක්වා නව දුම්රිය සේවාවක් ඇරඹීම.
- මගී සුව පහසුව ඇති කිරීම සඳහා දිනපතා මරදාන සිට වාද්දුව දක්වා ධාවනය වූ දුම්රිය දකුණු කළුතර දක්වා දීර්ඝ කිරීම.
- මරදාන සිට මාතර දක්වා ධාවනය වූ දුම්රිය බෙලිඅත්ත දක්වා දීර්ඝ කිරීම.
- මාතර සිට ආරම්භ වී මරදාන දක්වා ධාවනය වූ දුම්රිය බෙලිඅත්ත දුම්රිය ස්ථානයේ සිට ආරම්භ වීම.
- දුම්රිය ස්ථාන විවේක කාමර නවීකරණය හා ඒවා මගීන්ට පහසුවෙන් වෙන් කර ගත හැකි වන ක්‍රමවේද හඳුන්වා දීම.
- නව දුම්රිය සේවා හඳුන්වා දීම.
- නගරාන්තර දුම්රියන්ගෙන් ගමන් කිරීමට ප්‍රවේශපත් වෙන් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු වැඩි දියුණු කිරීම.
- දුම්රිය පරිශ්‍රයන් තුළ සුළු අලෙවිසැල්, කඩ කාමර, රථ ගාල් වැනි අංග ඇති කිරීමෙන් දුම්රිය මගීන්ට අමතර සේවාවන් ලබා දීම.
- දුම්රිය ඉඩම් බදු දීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.

2.11 ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

ගුණාත්මක කාර්මික ශිල්පීන් බිහි කිරීමේ අරමුණෙන් ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය සිය කාර්යභාරය 2019 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. පුහුණුව ලබන සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, වෘත්තීය පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ පුහුණු වන ආධුනිකයන්ගේ ඇගයීම් කටයුතු සිදු කිරීම, විශ්ව විද්‍යාල සිසුන්ගේ වැඩ බිම් පුහුණු අධීක්ෂණ කටයුතු සිදු කිරීම ආදී කාර්යයන් මෙමඟින් සිදු කොට ඇත.

මෙම ආයතනය මඟින් කරගෙන යනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක වේ. ජාතික වෘත්තීය සුදුසුකම් National Vocational Qualification තත්වයන් ඇතුළත් පූර්ණකාලීන පාඨමාලා මේ යටතේ පවත්වාගෙන යනු ලබයි.

ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මඟින් 2019 වර්ෂයේදී පවත්වා ගෙන යන පාඨමාලා හා පුහුණුව ලබන හා පිටව ගිය සංඛ්‍යාව වගු අංක 14 න් දැක්වේ.

අංකය	පාඨමාලාව	පුහුණුව ලබන සංඛ්‍යාව
01	ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී	26
02	යන්ත්‍රකරු	19
03	විදුලි ශිල්පී	29
04	පෑස්සුම්කරු	18
	එකතුව	**92**

වගු අංක 14

අදාළ ආයතන සඳහා කර්මාන්ත ගත පුහුණුව ලබා දීම පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

#	ආයතනය	සිසුන් ගනන
1	EUG	03
2	ඉංජිනේරු තාක්ෂණ ආයතනය	54
3	CINEC	03
4	SLIIT	01
5	කාර්මික විද්‍යාල	03
6	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය	06
7	NDT	08
8	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	01
9	UNIVOTEC	04
10	BET	08
	එකතුව	**91**

වගු අංක 15

2.12 දුම්රිය ආරක්ෂක සේවය

